# කටපාඩම් පද - 7 ශ්‍රේණිය

## බයිබල් පාඨ

1) ඔහු මට අයැදින්නේ නම්, මම පිළිතුරු දෙන්නෙමි, දුකේදී ඔහු සමඟ සිට ඔහු මුදා මම ඔහුට ගරු කරන්නෙමි - **ගීතාවලිය** 91:15

2) සමිඳාණෝ පීඩා විඳින්නන්ට යුක්තිය ඉටු කර දෙන සේක; සාගිනි වූවන්ට ආහාර දෙන සේක. - **ගීතාවලිය** 146 :7

3) එතුමාණෝ මාගේ සියලු පාප කමා කරන සේක; මාගේ සියලු රෝග සුව කරන සේක. - **ගීතාවලිය** 103 : 3

4) දෙවිඳාණෝ අපේ ශක්තිය හා සරණ වන සේක; හැම දා විපතේ දී අප හට පිළිසරණක් වන සේක - **ගීතාවලිය** 46 :1

5) හිමිසඳ මාගේ ආලෝකය හා විමුක්තිය ය;මම කිසිවෙකුට බිය නොවෙමි හිමිසඳ මාගේ ජීව ශක්තිය ය; මට භීතියක් නැත - **ගීතාවලිය** 27 :1

6) ජීවමාන සියල්ලෝ සමිඳුන් පසසත් වා! සමිඳුන්ට ප්‍රශංසා වේවා! - **ගීතාවලිය** 150:6

7) අහෝ මාගේ දෙවිඳුනි! මාගේ සතුරන්ගෙන් මා මුදා ගත මැනව; මට පහර දෙන අයගෙන් මා රැකගත මැනව. - **ගීතාවලිය** 59:1

## අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය

8) ශුද්ධාත්මානුභාවයෙන් ඔවුන්වහන්සේ ගැබ වැස කන්‍යා මරිය තුමියගෙන් උපන්නා හ - 3 **වගන්තිය**

9) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ, පොන්සියුස් පිලාත් යටතේ, කුරුසියෙහි ඇණ ගසනු ලැබ, මරණයේ වේදනා විඳ, උකුත් වී තැන්පත් කරනු ලැබූ සේක - 4 **වගන්තිය**

10) ඔවුන්වහන්සේ පාතාලයට බැස, තුන්වෙනිදා මළවුන් කෙරෙන් උත්ථාන වී වදාළ සේක - 5 **වගන්තිය**